**ශීර්ෂය 290 ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 16 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුනි 21 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) ආදායම් ලැබීම්**

දෙපාර්තමේන්තුවට අදාළ ආදායම් ලැබීම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2021 දෙසැම්බර් 09 දින විසිතුරු මසුන් ප්‍රති අපනයනය කිරීම සඳහා බලපත්‍ර වෙනුවෙන් ගෙවන ලද රු.20,000 ක් ආදායමට එකතු කරනු වෙනුවට පොදු තැන්පත් ගිණුමේ තැන්පත් ලෙස ගිණුම්ගත කර තිබීම නිසා ආදායම රු.20,000 ක් අඩුවෙන් දක්වා තිබුණි. | විසිතුරු මසුන් ප්‍රතිඅපනයනය සඳහා 2021.12.09 දින Ominta Aquarium International ආයතනය විසින් ගෙවා ඇත්තේ රු. 10,000ක් පමණි. ඒ සඳහා අදාල ආයතනය විසින් NAQDA ආයතනය වෙතින් ලබාගත යුතු නිර්දේශය ලබාගෙන නොමැති නිසා බලපත්‍රය නිකුත් කර නොමැත. ඒ අනුව එම මුදල් ලැබීම් පොදු තැන්පත් ගිණුමට බැර කර ඇති බව. | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ii) | ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන සමඟ වූ හිඟ ආදායම් ප්‍රකාශය (ACA-1(i)) අනුව 2021 දෙසැම්බර් 31 දිනවන විට 2018 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා යාත්‍රාංගන ලියාපදිංචි කිරීමේ හිඟ ආදායම රු.123,000 ක් වුවද විගණනයට ඉදිරිපත් කරන ලද හිඟ ආදායම් වාර්තා අනුව උක්ත කාලපරිච්ඡේද සඳහා හිඟ ආදායම් එකතුව රු.278,000 ක් ලෙස දැක්වීම නිසා මූල්‍ය ප්‍රකාශනවල රු.155,000 ක වෙනසක් නිරීක්ෂණය විය. | එකඟ වී ඇති බව. | මූල්‍ය ප්‍රකාශනවල හිඟ ආදායම් නිවැරදිව ඉදිරිපත් කළ යුතුය. |
| (iii) | 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ හිඟ ආදායම් ප්‍රකාශය ACA-1(i) අනුව 2021 ජනවාරි 01 දිනට ආරම්භක හිඟ ආදායම් ශේෂය රු.8,381,000 ක් ලෙස දක්වා තිබුණ ද 2020 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් ප්‍රකාශයට අනුව ශේෂය රු.4,437,199 ක් ලෙස දක්වා තිබීම | අතපසුවීමකින් වන අතර සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී එම වරද නිවැරදි කර, අමු මසුන් ආනයන, අපනයන හා ප්‍රතිඅපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම සඳහා ලැබිය යුතු ගාස්තු ලෙස රු.8,250,000ක් දක්වා ඇති බව. | පෙර වර්ෂ මූල්‍ය ප්‍රකාශනවල කරන ලද වෙනස්කම් හෙළිදරව් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | හේතුවෙන් 2021 වර්ෂයේ ආරම්භක ශේෂය රු.3,943,801 ක් වැඩියෙන් දක්වා තිබුණි. ඉකුත් වර්ෂයේ අවසානයට අමු මසුන් ආනයනය අපනයනය සහ ප්‍රති අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම වෙනුවෙන් ලැබිය යුතු රු.4,151,199 ක හිඟ ආදායම වෙනුවට රු.8,250,000 ක හිඟ ආදායමක් සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස දැක්වීම ඊට හේතු වී තිබුණු බව අනාවරණය වුවද මූල්‍ය ප්‍රකාශවලින් ඒ පිළිබඳව හෙළිදරව් කර නොතිබුණි. | | |
| (iv) | 2020 දෙසැම්බර් 23 දින මාස් ලංකා ආයතනය විසින් අමු මසුන් අපනයනය සඳහා මාර්ග ගත ක්‍රමය යටතේ ගෙවීම් කරන ලද රු.100,000 ක මුදලට අදාල බලපත්‍රය කළමනාකරණ අංශය විසින් නිකුත් කොට තිබිය දී එම වර්ෂයේ ආදායමට නොගෙන 2021 වර්ෂයේ ආදායමට ගෙන තිබීම නිසා වර්ෂයේ ආදායම රු.100,000 ක් වැඩියෙන් පෙන්නුම් කර තිබුණි. මුදල් රෙගුලාසි 175(1)(ආ) පරිදි එක් එක් පුද්ගලයාගෙන් ලැබිය යුතු මුදල පිළිබඳ වාර්තා සටහනක් තබාගෙන විධිවූ පරිදි මුදල් එකතු කරගන්නා බවට සහතික වී නොතිබුණු හෙයින් මෙම මුදල සමාලෝචිත වර්ෂය තුළ එකුතකර ගත් ආදායමක් නොවන බව හඳුනාගැනීමට නොහැකි වී තිබුණි. | මු.රෙ 175(1)(ආ) ප්‍රකාරව එක් එක් පුද්ගලයාගෙන් ලැබිය යුතු මුදල් පිළිබඳ වාර්තා සටහන් තබාගෙන එම මුදල් විධිමත් පරිදි අයකර ගැනීමට කටයුතු කරන ලෙසට අදාල අංශ දැනුවත් කරන ලද බව. | සමාලෝචිත වර්ෂය තුළ එකතුකර ගත් ආදායම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (v) | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව මුළු බදු ආදායම රු.64,606,538 ක්වූ අතර එම ආදායම් එකතුවට සමාන වන ලෙස දෙපාර්තමේන්තු ලේඛනවල සඳහන් අගයන් වෙනස් කර තිබුණද එම වෙනස්කිරීම් කිසිවක් වගකිව යුතු නිලධාරියෙකු සහතික කර නොතිබුණි. | සිගාස් (Cigas) පරිගණක වැඩසටහන හරහා ඇතුලත් කරන ලද ආදායම වූ රු. 64,606,538 නිවැරදිව භාණ්ඩාගාර මුද්‍රිත අනුව ද තහවුරු වන බව. | වෙනස් කිරීම් සිදුකර ඒ බව වගකිව නිලධාරියකු සහතික කර සනාථ කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (vi) | 2021 වර්ෂයේ මුහුදු කුඩැල්ලන් අපනයන බලපත්‍ර ආදායම වශයෙන් මුදල් අංශය වෙත ලැබීම්වල එකතුව රු.4,882,500 ක් ලෙස සඳහන් වුවද විගණනය සඳහා කළමනාකරණ අංශය විසින් ඉදිරිපත් කළ ලේඛන අනුව මුහුදු කුඩැල්ලන් අපනයන බලපත්‍ර ආදායම රු.4,912,500 ක් වුයෙන් රු.30,500 ක වෙනසක් නිරීක්ෂණය විය. | මූල්‍යාමය වරදක් සිදුවී නැති බව. | සියලු අංශ අතර සම්බන්ධීකරණය විධිමත්ව සිදුවිය යුතුය. |
| (vii) | සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් වර්ග 07 ක් වෙනුවෙන් එක් එක් අංශ විසින් බලපත්‍ර නිකුත් කර ඇතත් එම ආදායම් මුදල් අංශයේ ලේඛන සමඟ නොගැලපීම සම්බන්ධයෙන් බලපා තිබුණු හේතු මොනවාද යන්න හඳුනා ගැනීමට කළමණාකරණය කටයුතු කර නොතිබුණි. | මේ පිළිබඳ අදාල අංශ සමඟ සාකච්ඡා කර වාර්තා නිවැරදිව පවත්වාගෙන යාමට උපදෙස් දෙන ලද බව. | සියලු අංශ අතර විධිමත් සම්බන්ධීකරණයක් සිදුවිය යුතුය. |

**(ආ) මූලධන වියදම්**

---------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට හා භාණ්ඩාගාර මුද්‍රිත SA 82 සාරාංශයට අනුව මූලධන වත්කම් අත්පත් කරගැනීම යටතේ රු.16,574,347 ක් පෙන්වා තිබුණ ද ACA-6 ජංගම නොවන වත්කම් ප්‍රකාශයේ මූලධන වත්කම් මිල දී ගැනීම් එකතුව රු.289,986,291 ක් ලෙස රු.273,411,944 ක් වැඩියෙන් දක්වා තිබුණි. | භාණ්ඩාගාර මුද්‍රිත SA 82 සාරාංශයේ මූලධන වත්කම් අත්පත් කර ගැනීම් යටතේ දක්වා ඇති රු. 16,574,347ක වටිනාකම ACA 6 සටහනේ සමාලෝචිත වර්ෂයේ මිළදී ගැනීම් යටතේ නිවැරදි ලෙස වර්ගීකරණය කර දක්වා ඇති බව. | භාණ්ඩාගාර මුද්‍රිත සමඟ මූලධන වත්කම් සසඳා නිවැරදිව ශේෂය ඉදිරිපත් කළ යුතුය. |

**(ඇ) තැන්පතු**

---------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.8,518,925 ක යාත්‍රා සුපරීක්ෂණ ඒකකය පුළුල් කිරීමේ කුළි වැඩ අත්තිකාරම් ශේෂය 2019 වර්ෂයේ දී අයකර ගැනීම පිළිබඳව දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩාගාරය වෙත දැනුම් නොදීම නිසා භාණ්ඩාගාර පොත්වල (SA-90) අංක 9189 දරන වැය යටතේ 2021 | මෙම ශේෂය මෙම වර්ෂය තුල නිරවුල් කිරීමට කටයුතු කරන බව. | දෙපාර්තමේන්තු ගනුදෙනු භාණ්ඩාගාරයට නිවැරදිව වාර්තා කළ යුතුය. |

දෙසැම්බර් 31 දින වන විට ද ඉදිරියට ගෙන ගොස් තිබුණි. එහෙත් දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂයේ දී ද භාණ්ඩාගාර පොත් සමඟ සසඳා නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 ආදායම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශ සමඟ වූ සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව සහ සත්‍ය ආදායම අතර විචලතා පැහැදිලි කිරීම ආකෘතියේ රු.64,573,638 ක් වූ සත්‍ය ආදායම හා රු.43,000,000 ක් වූ සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව අතර වෙනසට දක්වා තිබූ හේතු සාධාරණ නොවන අතර බලපත්‍ර ආදායම් සංශෝධනය කළ නව ගැසට් පත්‍රය හේතුවෙන් එතරම් විශාල ආදායමක් ලැබී නොතිබූ බව නිරීක්ෂණය විය. බලපත්‍ර අලුත් කිරීම් වැඩි ප්‍රමාණයක් දෙසැම්බර් මස සිදුවීම නිසා දෙසැම්බර් මාසයේ ආදායම වැඩි වී තිබුණ ද රු.21,606,538 ක හෙවත් සියයට 50 ක අතිරික්තයක් සම්බන්ධයෙන් දක්වා තිබූ හේතු සාධාරණ නොවන බව නිරීක්ෂණය විය. | 2021 වර්ෂයේ නොවැම්බර් හා දෙසැම්බර් මාසවල රටතුල යම් තරමකට යහපත් වාතාවරණයක් ගොඩනැගීම හේතුවෙන් හා 2021.11.24 දින නිකුත් කළ 2255/22 අංක දරන නව ගැසට් පත්‍රය හේතුවන් සත්‍ය ආදායම වැඩිවී ඇති බව. | ආදායම නිවැරදිව ඇස්තමේන්තු කිරීමට ක්‍රියාකළ යුතු අතර, සත්‍ය ආදායම හා ඇස්තමේන්තු අතර වෙනස්කමට හේතු නිවැරදිව හඳුනාගත යුතුය. |
| (ආ) | ආදායම් ඇස්තමේන්තු සකස් කිරීමේ දී හැකිතාක් දුරට තාත්වික හා සාධාරණ අගයන් ඇතුළත් කළ යුතු බව 2020 මැයි 28 දිනැති අංක TOD/Rev/M2/01 දරන භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ 2021 වර්ෂයේ ආදායම් ඇස්තමේන්තු සකස් කිරීම සම්බන්ධයෙන් වූ ලිපියේ 02 ඡේදය ප්‍රකාරව දන්වා තිබුණ ද, 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා එක් එක් වර්ෂයේ ආදායම් ඇස්තමේන්තු සකස් කිරීමේ දි එම නියමයන් පිලිපැද නොතිබුණි. | ඉදිරියේදී අඩුපාඩු අවම වන ආකාරයට හා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් ප්‍රකාරව කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලද බව. | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් ප්‍රකාරව ක්‍රියාකළ යුතුය. |
| (ඇ) | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි විසින් හිඟ හෝ අතිරික්ත ආදායම් සඳහා හේතු විමසීම් මැයෙන් නිලධාරීන් වෙත නිකුත් කර තිබුණු ලිපිවලට අනුව 2021 වර්ෂයේ සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව රු.43,206,000 ක් ලෙස සඳහන් කර තිබුණ ද අනුමත සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව රු.43,000,000 ක් වූයෙන් | 2021 වර්ෂයේ රැස්කරන ලද ආදායම නිවැරදිව ගිණුම් ගත කර ඇති බව. | සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව හා සත්‍ය ආදායම නිවැරදිව දැක්වීමට |

| | | | |
|---|---|---|---|
| | රු.206,000 ක වෙනසක් ද උක්ත ලිපිවලට අනුව සත්‍ය ආදායම රු.64,819,638 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල සත්‍ය ආදායම රු.64,573,638 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.246,000 ක වෙනසක් ද නිරීක්ෂණය විය. එහෙත් ඊට හේතු වූ කරුණු නිරීක්ෂණය නොවිය. | | ක්‍රියාකළ යුතුය. |
| (ඇ) | 2021 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් ප්‍රකාශයට ACA-1(i) අනුව හිඟ ආදායම් රු.8,605,000 ක් වී තිබුණු අතර අය කර ගත් හිඟ ආදායම රු.42,000 ක් වුයෙන් හිඟ ආදායම් අයකර ගැනීමේ ප්‍රගතිය සියයට 0.5 ක පමණ ඉතාම දුර්වල මට්ටමක පැවතුණි. | අමු මසුන් ආනයන අපනයනය හා ප්‍රතිඅපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම සඳහා හිඟ ආදායම වූ රු. මිලියන 8.25 නැවත අයකර ගත නොහැකි ආදායමකි. අනෙකුත් හිඟ ආදායම් අයකර ගැනීමට අදාල අංශවලට උපදෙස් දෙන ලදි. | හිඟ ආදායම් කඩිනමින් අයකරගැනීමට ක්‍රියාකළ යුතුය. |

**2.2 වියදම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් 4 කට අදාලව රු.19,500,000 ක්වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබූ අතර වැය විෂයයන් 5 කට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිවීම් සියයට 25 සිට සියයට 81 ක් දක්වා පරාසයක විය. | මහා භාණ්ඩාගාරය විසින් අයවැය ඇස්තමේන්තු සංශොධනයක් සිදු නොකළ බැවින් එම ඉතිරිවීම් දෙපාර්තමේන්තු වැය විෂයන් යටතේ ඉතිරිවීම් ලෙස පෙන්නුම් කිරීම නිසා බව. | අපේක්ෂිත සංවර්ධන කාර්යයන් ඉටුකරගැනීමට කටයුතු සලසා ගත යුතුය. |
| (ආ) | වැය විෂයයන් 2 කට අදාල සත්‍ය වියදම සැලකිල්ලට ගත් විට වාර්ෂික අයවැය ඇස්තමේන්තු මඟින් වෙන්කළ ප්‍රතිපාදන ප්‍රමාණවත්ව තිබිය දී මුදල් රෙගුලාසි 66 යටතේ රු.500,000 ක ප්‍රතිපාදන මාරු කරගෙන වැය නොකර ඉතිරි වී තිබුණි. | නිසි කලට වවුචර් ගෙවීම් සඳහා ඉදිරිපත් නොවීම බව. | විධිමත් සැලසුමක් සහිතව ප්‍රතිපාදන මාරුකළ යුතුය. |
| (ඇ) | ඇස්තමේන්තු කිරීමේ දුර්වලතාවයක් හේතුවෙන් වැය විෂයයන් දෙකක් වෙනුවෙන් පිළිවෙලින් සියයට 100 ක් හා සියයට 131 ක් දක්වා පරිපූරක මඟින් එකතුව රු.23,100,000 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණු අතර එයින් ඉතිරි වූ එකතුව රු.3,600,000 ක් වෙනත් වැය විෂයයන් දෙකකට මාරු කර තිබුණි. | වියදම් අරපිරිමැස්මෙන් සිදුකිරීම හා රට තාවකාලිකව වසා තැබීම නිසා ප්‍රතිපාදන යම් ප්‍රමාණයක් ඉතිරිවීම හේතුවෙන් හා නීති විරෝධී ධීවර වැටලීම් සඳහා වන වවුචර් ප්‍රමාද වී ඉදිරිපත් වීම නිසා ප්‍රතිපාදන ඉතිරිවීම මත මු.රෙ 66 යටතේ ප්‍රතිපාදන මාරුකර ඇති බව. | විධිමත් සැලසුමක් මත ප්‍රතිපාදන මාරුකළ යුතුය. |

**2.3 බැංකු ගිණුම් මෙහෙයවීම**

**----------------------------**

බැංකු ගිණුම් මෙහෙයවීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ අඩුපාඩු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනවන විට එකතුව රු.13,221,325 ක කල්ඉකුත් වූ චෙක්පත් 43 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පිළිගෙන ඇති බව. | මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව ක්‍රියාකළ යුතුය. |
| (ආ) | 2021 ජනවාරි සිට දෙසැම්බර් දක්වා අවස්ථා 9 කට අදාල උපලබ්ධි නොවූ ලැබීම් එකතුව රු.17,280 ක් ද අවස්ථා 39කට අදාලව හඳුනානොගත් ලැබීම් එකතුව රු.942,670 ක් ද හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිගෙන ඇති බව. | මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව ක්‍රියාකළ යුතුය. |
| (ඇ) | 2021 ජනවාරි හා දෙසැම්බර් මාසවලට අදාලව අවස්ථා 2 කදී හඳුනානොගත් ගෙවීම් රු.18,500 ක මුදල හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිගෙන ඇති බව. | මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව ක්‍රියාකළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**----------------------------**

**3.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

**---------------------------------**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි. | 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2021 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තා සකස් කර ඉදිරිපත් කිරීමට උපදෙස් දෙන ලදි. | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකළ යුතුය. |

## 3.2 කළමනාකරණ දුර්වලතා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නව තාක්ෂණය හඳුන්වාදීම යටතේ මත්ස්‍ය ගහනය වැඩි කිරීමේ අරමුණින් සමුද්‍රිය පරිසර පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා අතහැර දැමූ ධීවර යාත්‍රා, බස්රථ, දුම්රිය මැදිරි යොදාගෙන ත්‍රිකුණාමලය, යාපනය, ගාල්ල, මාතර යන දිස්ත්‍රික්කවල ගිල්වීමේ ව්‍යාපෘතිය 2020 ජූලි මාසයේ දී ආරම්භ කර 2021 දෙසැම්බර් අවසන් කර තිබුණු අතර ඒ සඳහා ඉකුත් වර්ෂය තුල දී හා සමාලෝචිත වර්ෂය තුල දී වරාය නීතිගත සංස්ථාවට රු.18,274,800 ක්ද, ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයට රු.10,952,406 ක්ද ගෙවා තිබුණි. එහෙත් මෙම ව්‍යාපෘතියේ සාර්ථකත්වය පිළිබඳව පසුවිපරම් කටයුතු සිදුකර තිබූ බවක් අනාවරණය නොවීය. | සාගර පතුලේ ස්ථාන නිවැරදිව හඳුනාගැනීම සඳහා සිතියම් කරලීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා උපදෙස් හා අවශ්‍ය මූලික කටයුතු සිදුකරලීම සඳහා ශ්‍රී ලංකා වෙළඳ හා නාවික අමාත්‍යාංශයේ අධ්‍යක්ෂකවරයා දැනුවත් කර ඇති බවත් නාවික ආඥාපති සමඟ පැවති සාකච්ඡා කීපයකදීම අවසන් කළ ව්‍යාපෘතිවල අදාල ප්‍රදේශ නිරීක්ෂණය කර වාර්තාවක් ලබාදෙන මෙන් වාචිකවද ඉල්ලීම් සිදුකර ඇති බව. | ව්‍යාපෘතියේ අරමුණු ඉටු වී ඇද්ද යන්න තහවුරු කර ගැනීමට පසුවිපරම් කටයුතු සිදුකළ යුතුය. |